කන්දකැටිය ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගලඋඩ ජල ව්‍යාපෘතියට අදාල ණයහිමියෝ රු.204,431 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් ණය හිමියන් සහ වර්ෂයේ වියදම එම වටිනාකමින් අඩුවෙන් දැක්වේ. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.41,000 ක බැකෝ ලෝඩර් යන්ත්‍ර සේවා කුලිය ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.3,996,204 ක ස්ථාවර තැන්පතු 2 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබිය යුතු පොලිය රු.1,789,844 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු මන්ත්‍රී දීමනා රු.510,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | දැනට නිවැරදි කර ඇත. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.5,903,860 ක වත්කම් විෂයයක් සහ රු.156,476 ක ණයහිමි ශේෂ 02 ක් ඔප්පු,පිඹුරුපත් හා නියෝග,තක්සේරු වාර්තා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතුවේ. | සාක්ෂි සොයා බලා අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවති. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158,159 වගන්ති | සමාලෝචිත වර්ෂයට අදාල රු.146,250 ක හිඟ ආදායම් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කිරීමට නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා(මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 218 | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 218 අනුව කටයුතු කළ යුතුවේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කිරීමට නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------<br>මුදල් රෙගුලාසි 371 | ප්‍රාදේශීය සභාව විසින් 2002, 2006 හා 2011 වර්ෂ වලදී පාර්ශවකරුවන් තිදෙනෙකුට අවස්ථා 04 කදී ගෙවා තිබුණු | අග්‍රිම එම කාර්ය නිම වූ වහාම පියවා ගත යුතුවේ | අග්‍රිම පියවා ගැනීමට කටයුතු කරමි. |

රු.67,500 ක අග්‍රිමයන් පියවා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,247,092 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,542,705 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු (ජල බදු, අක්කර බදු) | - | 2,183,000 | 2,111,496 | 71,504 | - | 1,615,695 | 1,739,378 | - |
| ii. | කුලී(පොල,කඩ) | - | 2,145,701 | 2,112,901 | 32,800 | - | 1,877,742 | 1,874,742 | 2,500 |
| iii | බලපත්‍ර ගාස්තු | 848,000 | - | 806,050 | 41,950 | 648,000 | - | 898,850 | - |
| iv | වෙනත් ආදායම් (කුලී ආදායම්) | 333,500 | - | 567,513 | - | 333,500 | - | 491,583 | - |
| | එකතුව | 1,181,500 | 4,328,701 | 5,597,960 | 146,254 | 981,500 | 3,493,437 | 5,004,553 | 2,500 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති උසාවි දඩ රු.1,300,000 ක් අය කර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් අයකරගත යුතුවේ. | උපලේඛන පළාත් පාලන කොමසාරිස් මඟින් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය වෙත යොමු කර ඇත. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති මුද්දර ගාස්තු රු.600,000 ක් අය කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකරගත යුතුවේ. | උපලේඛන පළාත් පාලන කොමසාරිස් මඟින් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය වෙත යොමුකර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කාරණා 23 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පැනවීමට හෝ වැළඳ ගැනීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | මෙම වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2012 ඔක්තෝබර් 05 දිනැති අංක 1178/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන තිබුණද, කසල බදු අය කලයුතු පරිශ්‍රයන් හඳුනාගෙන බදු අය කර නොතිබුණි. | ගැසට් නිවේදනය අනුව කසල බදු අය කල යුතුවේ. | ඉදිරියේදි කසල බදු අය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරිමට උපදෙස් ලබාදී ඇත. |

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතීන්ගේ " තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කර ගත හැකි වන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වසර 03 කට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර, ප්‍රතිපූර්ණය කරගත යුතු කර්මාන්ත වියදම් සහ හිඟහිටි කඩ ටෙන්ඩර් ගාස්තු එකතුව රු.13,252,744 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | අයවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන හිඟ ආදායම් අය කරගත යුතුවේ. | අයවිය යුතු පාර්ශවයන් හඳුනාගෙන හිඟ ආදායම් අය කර ගනිමි. |
| (ආ) | වසර 05 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණය හිමි, කර්මාන්ත ණයහිමි සහ විශ්‍රාම වැටුප් ශේෂ එකතුව රු.13,514,162 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 01 කට අදාල අතිරික්ත කාර්ය මණ්ඩලය 02 ක් විය. | කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුවේ. | මෙම වර්ෂය තුල අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 11 කට අදාලව පැවති පුරප්පාඩු 11 ක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු පිරවිය යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව හා මේ වන තෙක් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොමැත. |

3.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදි පිළියෙල කිරිමට කටයුතු කරමි. |

3.5 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| කැබ් රථයක් හා ට්‍රැක්ටර් රථයක් වසර 06 ක පමණ කාලයක් නිෂ්ක්‍රීයව සහා භූමියේ ගාල්කර තිබුණි. | අදාල වත්කම් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුවේ. | කැබ් රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට සැලසුම් කර ඇත. |

4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

4.1. විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක ඩීඑම්ජ්/2009(01) දරන 2009 ජූනි 09 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් පැවැත්විය යුතු වුවද,සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |